යම් පුවත් වාර්තාවක පුද්ගලයෙකුගේ කුලය සම්බන්ධ විස්තර පුවතට සෘජුවම අදාළ වන්නේ නම් විනා, එසේ නැතිව ප්‍රකාශයට පත් කිරීමෙන් වැළැකිය යුතු බව මාධ්‍ය ආචාර ධර්ම තුළින් කියැවේ.

මේ අතර, බොහෝ අවස්ථාවන් වලදී පුවත් වාර්තාවන් තුළ විවිධ සිදුවීම් වලට අදාළ පුද්ගලයන්ගේ නම් සඳහන් කිරීමේදී, සම්පූර්ණ වාසගම්/පෙළපත් නාමයන් සහිතව දැක්වෙන බවද නිරීක්ෂණය කළ හැකි වේ. මෙසේ සම්පූර්ණ වාසගම්/පෙළපත් නාමයන් සහිතව නම් ඉදිරිපත් වන්නේ, මාධ්‍යවේදීන් එම තොරතුරු ලබාගැනෙන්නේ පොලිස් වාර්තා හෝ වෙනත් නෛතික ලියකියවිලි ඔස්සේ වීම නිසා විය හැක. නමුත්, එම සම්පූර්ණ වාසගම්/පෙළපත් නාමයන් ඔස්සේ යම් අයෙකුගේ කුලය හෙළිදරව් වීමට හැකියාවක් ඇති බවද නොසලකා හැරීමට නොහැක. එසේ තම කුලය මාධ්‍ය ඔස්සේ හෙළිවනවාට අකමැති අයවලුන්ද සිටිය හැකි බවද නොසලකා හැරීමට නොහැක. ඒ අයුරින් බලන විට, සම්පූර්ණ වාසගම්/පෙළපත් නාමයන් සහිතව පුද්ගලයන්ගේ නම් පුවත් වාර්තාවන් තුළ දැක්වීම අත්‍යාවශ්‍ය වේ යැයි ඔබ සිතන්නේද? එසේ නැතිනම් එහි ගැටළුවක් නැතැයි ඔබ සිතන්නේද?

**#MediaEthicsSL #lka #SinhalaNews #Divaina #Mawbima #Dinamina**